දිනමිණ සිළුමිණ epaper

# ජාතික මූලික අධ්‍යයන ආයතනය (NITF)

ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් පහත සඳහන් ඇබෑර්තු සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** පර්යේෂණ අධි සාමාජික
**02.** සම්බන්ධීකාරක
**03.** පරිපාලන නිලධාරී II ශ්‍රේණිය
**04.** තාක්‍ෂණ නිලධාරී III ශ්‍රේණිය
**05.** රියදුරු III ශ්‍රේණිය
**06.** කළමනාකරණ සහකාර

01. **සුදුසුකම්**

## පර්යේෂණ අධිසාමාජික

i. පිළිගත් ආයතනයකින් ලබාගත් භෞතික විද්‍යා/ ජීව විද්‍යා හා සම්බන්ධ විෂයයන්/ රසායනවිද්‍යාව/ භෞතික විද්‍යාව පිළිබඳ විශේෂ සාමාර්ථයන් සහිතව පළමු පංතියේ හෝ දෙවන පංතියේ (ඉහළ කොටස) ගෞරව සහිත උපාධියක්

**හෝ**

පිළිගත් ආයතනයකින් ලබාගත් භෞතික විද්‍යා/ ජීව විද්‍යා හා සම්බන්ධ විෂයයන්/ රසායන විද්‍යාව/ භෞතික විද්‍යාව පිළිබඳ විශේෂ සාමාර්ථයන් සහිතව දෙවන පංතියේ (පහළ කොටස) ගෞරව උපාධියක් සමග අඩුතරමින් එක් වසරක පශ්චාත් උපාධි පර්යේෂණ පළපුරුද්ද

**හෝ**

පිළිගත් ආයතනයකින් ලබාගත් භෞතික විද්‍යා/ ජීව විද්‍යා හා සම්බන්ධ විෂයයන්/ රසායන විද්‍යාව/ භෞතික විද්‍යාව පිළිබඳ විශේෂ සාමර්ථයන් සහිතව අඩුතරමින් දෙවන පංතියේ ගෞරව විද්‍යාවේදී - BSc - උපාධියක් සමග අවම වශයෙන් වසර දෙකක පශ්චාත් උපාධි පර්යේෂණ පළපුරුද්ද.

**සහ**

ii. පිළිගත් ආයතනයකින් ලබාගත් භෞතික විද්‍යා/ ජීව විද්‍යා සම්බන්ධ විෂයයන්/ රසායන විද්‍යාව/ භෞතික විද්‍යාව පිළිබඳ දර්ශනශූරී - Phd උපාධිය

**හෝ**

ආචාර්ය උපාධියක් (M phil) සහ M Phil උපාධිය ලබා ගැනීමෙන් පසුව වසර දෙකක පර්යේෂණ පළපුරුදද සහ NIFS ලකුණුදීමේ යෝජනා ක්‍රමයට අනුව අවම වශයෙන් ලකුණු 50 ක් ලබා ගැනීම.

පහත දැක්වෙන ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි සුදුසුකම් සහිත අයට ප්‍රමුඛතාව හිමිවේ.

අ) සංක්ෂිප්ත මේටර් භෞතික විද්‍යාව
ආ) පැළෑටි ජීව විද්‍යා වර්ගීකරණය සහ සංරක්‍ෂණය
ඇ) ස්වභාවික නිෂ්පාදන
ඈ) ක්ෂුද්‍ර ජෛව තාක්‍ෂණය

**වයස :** අවුරුදු 60 ට වඩා වැඩි නොවිය යුතුය

**පාරිතෝෂිකය :**

රැකියා නියුක්තිය ස්ථිර පදනම මත වේ. වැටුප් පරිමාණය හා කේතය පහත පරිදි වේ.

U-AC3-11-2016A-79,360-11X1,630-97,290/-

## 2. සම්බන්ධීකාරක

**සුදුසුකම් :**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් (B.Sc) සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) උපාධියක්

ii. 1වන උපාධිය ලබා ගැනීමෙන් පසුව රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක වැඩසටහන් සම්බන්ධීකරණ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසර 15 ක පළපුරුද්ද.

iii. ජාත්‍යන්තර හා දේශීය සම්මන්ත්‍රණ සංවිධානය කිරීමේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.

**වයස :** වයස අවුරුදු 35 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය.

**පාරිතෝෂිකය**

රැකියා නියුක්තිය ස්ථිර පදනම මත වේ. වැටුප් පරිමාණය හා කේතය පහත පරිදි වේ.

HM **1-1-2016 A-81,670-15-X2,270-115,720+රජයේ දීමනා**

## 3. පරිපාලන නිලධාරී

**සුදුසුකම් :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධිය සමග රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වශයෙන් වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**වයස :** අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**පාරිතෝෂිකය**

රැකියා නියුක්තිය ස්ථිර පදනම මත වේ.

වැටුප් පරිමාණය හා කේතය පහත පරිදි වේ.

JM **1-1-2016- රු. 42,600-10X755-18X1,135-70,580+ රජයේ දීමනා**

## 4. තාක්‍ෂණ නිලධාරී III ශ්‍රේණිය

**සුදුසුකම් :**

අ.පො.ස. (උ/පෙළ) විභාගයේ විද්‍යාධාරාවෙන් සාමාර්ථ 3 ක් සහ පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව/ ICT පිළිබඳ පිළිගත් ආයතනයකින් ලබාගත් NVQ 5 මට්ටම නොඅඩු වසර 2 ක ඩිප්ලෝමාව සමග අ.පො.ස. (සා/පෙළ) විභාගය ගණිතය සහ භාෂාව (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) ඇතුළුව සම්මාන සාමාර්ථ 4 ක් සහිතව විෂයයන් හයකින් එක් වරකදී සමත්වීම.

ICT උපකරණ සහ ජාල පරිපාලනය පිළිබඳ පළපුරුද්ද සහිත අය කෙරෙහි විශේෂ ප්‍රමුඛතාව හිමිවේ.

**වයස :** අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**පාරිතෝෂිකය :**

රැකියා නියුක්තිය ස්ථිර පදනම මත වේ. වැටුප් පරිමාණය හා කේතය පහත පරිදි වේ.

MA**2-1-2016-30,310-10X300-7X350-4X495-20X660-50,940/- + රජයේ දීමනා**

## 05.රියදුරු

**සුදුසුකම්**

සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව අ.පො.ස. (සා/පෙළ) විභාගය එක් වරකදී විෂයයන් දෙකකින් සමත් වීම

**සහ**

බරවාහන පැදවීම සඳහා වලංගු බලපත්‍රයක් සහ පිළිගත් ආයතනයක බරවාහන පැදවීමේ අවම වශයෙන් වසර පහක පළපුරුද්ද සහිත වීම.

**වයස :** අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**පාරිතෝෂිකය :**

රැකියා නියුක්තිය ස්ථිර පදනම මත වේ. වැටුප් පරිමාණය සහ කේතය පහත පරිදි වේ.

PL**3-2016-26,290-10X270-10X300-10X330-12X350-39,490/-.**

කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත් පදනම)

**සුදුසුකම් :**

අ.පො.ස (උ/පෙළ) විභාගය එක්වරකදී විෂයන් 3 කින් සමත්වීම සහ අ.පො.ස. (සා/පෙළ) විභාගය සිංහල/ දෙමළ, ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව සම්මාන සාමර්ථ හතරක් සහිතව එක් වරකදී විෂයයන් හයකින් සමත්වීම.

**වැදගත් :**(අ) පරිගණක යෙදවුම් පිළිබඳ දැනුම

(උදා : වදන් සැකසුම, ස්ප්‍රෙඩ්ශීට්, ඉදිරිපත්කිරීම් සහ ලඝු ලේඛනය) ප්‍රත්‍යක්‍ෂ වාසියක් වනු ඇත.

(ආ) සිංහල හා දෙමළ බසින් වදන් සැකසුම පිළිබඳ දැනුම ප්‍රත්‍යක්‍ෂ වාසියක් වනු ඇත.

**වයස :** අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**පාරිතෝෂිකය :**

රැකියා නියුක්තිය කොන්ත්‍රාත් පදනම මත වේ.

**වැටුප් තලය :** 27,910/- + ජීවන වියදම් දීමනාව.

NIFS සේවක අර්ථසාධක අරමුදලට සේවකයින් විසින්, තම වැටුපින් 10%ක්ද, ආයතනය විසින් 15/- ක්ද, දායක වන අතර, ඊට අමතරව ආයතනය විසින් වැටුපින් 3% ක් සේවක භාරකාර අරමුදලට දායක වනු ඇත.

අයදුම්කරුවන් තම සම්පූර්ණ ජීව-දත්ත ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන්ද, වයස හා සුදුසුකම් සනාථ කිරීම සඳහා වන සහතික පිටපත්ද සමග මෙම දැන්වීම පළවූ දින සිට දින 21 ක් ඇතුළත එවිය යුතුය. අයදුම්කරන අදාළ තනතුර ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

**අයදුම්පත් පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.**

**ලේකම්,**
**ජාතික මූලික අධ්‍යයන ආයතනය,**
**හන්තාන පාර, මහනුවර.**
**දුරකථන : 081-2232002, ෆැක්ස් : 081-2232131.**

**අවසාන දිනය : 2024-01-21**